
(කෙටි කතාව) ☺




චබී 💔

(කෙටි කතාව) ☺

ඒයි පවි ඔහොම ඉදපන්කෝ............මට තවත් දුවන් එන්න බෑ යකෝ😭😭😭😭😭.......මහන්සියි...........😭😭" මම ඉන අල්ලන් පහත් වෙලා කිව්වා..........දුවලා වැඩි කමට.....මට හති......මම හති දානවා බලු පැටියෙක් වගේ දිවත් එලියේ දාගෙන.........😂

උඹට දුවන් එන්න බැරිනම්😂........රෝල් වෙලා හරි ඇවිල්ලා අල්ලපන් මාව.....😂😂😂"

උඹට මම කියන්නෑ...😭😭 නතර වෙයන් හරකියේ........😳😳......මට මහන්සියි 😒😒......"

හරි හරි මම නතර වුනා.........😂😟 වරෙන් ඉතින්..........හැබැයි උඹ ගහන්න බෑ හරිය..........😟"

හරි හරි ගහන්නෑ....😭😭"

ප්‍රොමිස්......😟"

ප්‍රොමිස්..........සත්තුන්ට ගහලා මම පවි පුරෝ ගන්නෑ😂😂🔫"මම කිව්වා.........ඒ පවනි මගේ හොඳම මගේ ලගම ඉන්න යාළුවා.....😂😂

උඹට මම කියන්නෑ😭😭😭😭...චබි........කිව්වායි කියලා හිතා ගනින්.........."පවි කිව්වා.....

මම ටෙලිශා රුවිනි..................පවුලේ එකම දරුවා............සල්ලිවලින් නම් කිසිම අඩුවක් නැහැ..............අපේ තාත්තාට බිස්නස් කිහිපයක්ම තියෙනවා.........වතුපිටිවලින් වගේම ඒ බිස්නස් වලින් අපිට කිසිම පාඩුවක් නෑ.........එත් මගේ ජීවිතේට ලොකුම පාඩුවක් වෙලා.........ඒ මම සාමාන්‍ය කෙල්ලෙක් වගේ නෙවෙයි...............ගොඩක් මහතයි.........ඒත් ඒ මහතත් මට ලස්සනයිලු යාළුවෝ තමයි කියන්නේ.......කට්ටිය මට ආදරේට කියන්නේ චබි කියලා......පවි මම ලගට ආවා මට හිනා වෙචි.......

ඉදා උඹේ මහා ලොකු චොකලට් කෑල්ල........🍫🍫පිස්සු බැල්ලි වගේ හති දාදා ආවේ චොකලට් කෑල්ලටනේ😂😂....."පවි කියලා හිනා වුනා........

යමන් යමන් අම්මිලා කෑගහයි.........අපි සුපර්මාර්කට් එකේම නතර වෙලා ඇති කියලා..........😂😂"අපේ තාත්තාගේ බිස්නස් වලින් එකක් තමා **R & T supermarket** එක මායි පවනියි ගියේ ඒකට වෙලා ටිකක් කාලේ ගත කරන්න...........වෙලාව ගියා වැඩි නිසා තාත්තාට කියලා අපි එන්න ආවා...ඒ එනකොට ගත්ත චොකලට් එකට තමා අපි දෙන්නා රංඩු වුනේ..........😂😂කියව කියව අපි දෙන්නා ගෙවල් ලඟටම පයින් ආවා.....අපේ ගෙවල් නිවාස සංකීර්ණයක්.......පෝසත් අය විතරක්ම ඉන්න නිවාස සංකීර්ණයක්....අපේ ගෙවල් වලට ගෙවල් දෙකක් එහායින් තමා පවනිගේ ගෙදර තියෙන්නේ.....මේ සංකීර්ණයේ ගෙවල් 36ක් තියෙනවා........එ ඔක්කොම එකටමයි ඉන්නේ...........මාසෙකට සැරයක් කට්ටිය එකතු වෙනවා ලොකු පොඩි කියලා නැහැ.......තරුණ කට්ටිය පුළුවන් හැමදාම එකතු වෙනවා.....හවසට ග්‍රවුන්ඩ් එකේදි.....කට්ටියම එකතුවෙලා සෙල්ලම් කරලා...සින්දු කියලා රෑ වෙනකන් ඉදලා තමයි කට්ටිය ගෙවල් වලට යන්නේ...........

පවී,චබ් පොඩ්ඩක් ඉදපන් බන්..........."කවුරුහරි කතා කරපු නිසා අපි දෙන්නා නතර වුණා....හැරිලා බලන කොට හිටියේ...ශේන්........හති දාදා ශේන් ආවා අපේ ළඟට...ශේන් කියන්නේ අපේ ගෙවල් පේලියෙම ඉදපු සමරනායක අංකල්ගේ පුතා......

මොකද බං...? "පවි ඇහුවා...

ධර්මේන්ද්‍ර අංකල්ල යනවා බන්.....ගෙවල් අත ඇරලා....හෙට යනවාලු.....කැනඩා වලට එයාලාගේ ලොකු පුතා එහේට එන්න කියලා........😒😒"

අප්පාද බොල එහෙමද...........😮"මට කියවුණා.......

අපි යමුද ඒ පැත්තේ..........."පවි ඇහුවා.........අපි තුන්දෙනා කියව කියව ධර්මේ අංකල්ලාගේ ගෙදර ආවා.......මගදි තෙනුකියි,සහනුයි,අවිශ්කයි එකතු වුනා.....

ආ මේ කට්ටියනේ.........එන්න එන්න ඇතුලට........."අපිව දැකලා ධර්මේ අංකල් ගේ ඇතුලට කතා කරා.....

අංකල්ලා කොහේ හරි යන්නද........"මම ඇහුවා........

ඔව් චබ් දූ..........අපි මෙහෙන් යනවා......ඔයාලාව දාලා යන්න දුකයි ඒත් අපිට මුනුබුරන් දකින්නේ නැතුව ඉන්න බැහැ....එකයි යන්නේ......එත් අපි ගියාට ආයේ එන්නම්කෝ ඔයාලාව බලලා යන්න.........."ධර්මේ අංකල් කිව්වා........අපි ටික වෙලාවක් කතා කර කර ඉදලා කාලා බිලා ගෙදර එන්න ආවා..........

ආ දූ දැන්ද ගෙවල් මතක් වුනේ.........යසයි කෙල්ලෝ ගෙදර එන වෙලාව........😟😟"ගෙදරට අඩිය තිබ්බා විතරයි අම්මාගේ හොද ටිකක් අහගත්තා......එනකොට වෙලාව 9ත් පහු වෙලා.....

අනේ මගේ සුදු බොලේ.......😌😌මම ධර්මේ අංකල්ලාගේ ගෙදර ගියානේ......ඒකනේ පරක්කු වුනේ.......හෙට එයාලා යනවාලු.......ඉතින් ටික වෙලාවක් කට්ටිය එක්ක කතා කර කර හිටියා...."අම්මගේ බෙල්ල බදාගෙන මම කිව්වා........

ඇත්තද දූ එයාලා හෙටද යන්නේ......මමත් තාත්තා ආවම ඒ පැත්තට ගිහින් බලන්න ඕනේ.......😒😒 "

හරි අම්මේ...😒😒"එහෙම කියලා මම කාමරය ඇතුලට ආවා.....

##################

චබියෝ ධර්මේන්ද්‍ර අංකල්ලගෙ ගෙදරට අලුත් කට්ටියක් ඇවිල්ලා.......කට්ටියම ගියා එහෙ....අපිටත් කතා කරන්...අපිත් යමු........."පවි එහෙම කියන් රූම් එකට ආවා..........මමත් ලෑස්ති වෙලා...පවි එක්ක එළියට ආවා....ධර්මේ අංකල්ලගෙ ගෙවල් පැත්තෙ ගියා..........

ආ චබී උඹලාත් ආවාද.........අපි ඒත් මේ කිය කිය හිටියේ උඹලා තාම ආවෙ නෑ කියලා...."අපිව දැක්ක ගමන් ශාන් කිව්වා.......

අඳුර ගන්න මේ තමා අපේ සෙට් එකට එන අලුත්ම පොර අශේන් අනුහස්........."අලුතෙන් ආව අශේන්ව ශාන් හඳුන්වලා දුන්නා......සුදුයි,උසයි,කොටින්ම කිව්වොත් හැන්ඩ්සම් පොරක්......😍😍😍කොච්චර ලස්සන කොල්ලො දැක්කාත් මගේ හිත ❤නම් හෙල්ලුනේ නැහැ........එත් අශේන්ව දැක්කාම හිත හෙල්ලුනා...

හායි අශේන්.....□"මම කිව්වා.......ටික වෙලාවක් කට්ටිය එක්ක කතා කර කර ඉදලා අපි ආවා........අශේන්ව දැක්ක වෙලාවේ ඉදලා මට එයාවම මතක් වුනා........

############

දූ තාත්තා සුපර්මාර්කට් එකට එන්න කියලා කතා කරා පවි දුවත් එක්ක පෙඩ්ඩක් ගිහින් බලලා එන්න........."ෆිල්ම් එකක් බල බල හිටිය මට අම්මා ඇවිල්ලා කිව්වා........මාත් පවිට කොල් කරලා.......එන්න කියලා ලෑස්ති වුනා........

එයි චබී උඹ දන්නවාද වැඩක්.....😮"

නෑ මොකක්ද.......□"

උඹ තවත් ලස්සන වෙලා....😊"

ඉතින් හොදයිනේ 😂😂 උඹට ඉරිසියාවද.😌😂යමන් යමන් තවත් පරක්කු වෙනවා....."

මමයි පවියි සුපර්මාර්කට් එකට ආවා....ස්ටොක් අවුලක් නිසා එක හදන්න පරක්කු වුනා.......මායි පවියි එක හදලා එනකොට පරක්කු වුනා.......කාර් එකත් ඇවිල්ලා නැති නිසා......මායි පවියි පයින්ම එන්න ආවා........💃💃 පිස්සු නට නට පාරේ ආවා........ටික දූරක් එනකොට කාර් එකක් අපි ලගින් නතර කරා........🚗

ආ ලමයි දෙන්නා කොහෙද යන්නේ........."

කාර් එකේ හිටියේ අශේන්...

අ◌ා මේ අශේන් නේ..........අපි මේ සුපර්මාර්කට් එක පැත්තේ ගියා..........රශිලාගේ "පවි කිව්වා.......

ආ එහෙමද..........එත් ඇයි පයින්...කාර් එක නැද්ද........"අශේන් ඇහුවා........

කාර් එක තාම ආවේ නැ අශේන්...කම්මැලි කමටත් එක්ක අපි දෙන්නා කියව කියව පයින් ආවා........ගෙදරට ටික දුරයිනේ කියලා........"පවි කිව්වා.........

එන්න මම ගිහින් බස්සන්නම්......"අශේන් කිව්වා.....පවි මගේ දිහා බැලුවා.....මමත් ඔළුව වැනුවා......පවියි මායි කාර් එකේ පිටිපස්සෙන් නැග්ගා.....

ඉතින් අශේන්......කොහොමද ඔයාලාට මේ පැත්ත හිතට ඇල්ලුවාද......."පවි ඇහුවා.......

අශේන් කියන්න එපා .....කැමතිනම් අශි කියන්න මගේ යාළුවෝ නම් අශි කියලා තමයි කතා කරන්නේ.....මේ පැත්තනම් හිතට ඇල්ලුවා......"අශේන් කිව්වා......මම අශි දිහාම බලන් හිටියා....මගේ ඒ වෙනස පවිටත් තේරුනාද කියලා නෙ◌ාදැනෙන තරම්.......

ඔයාලාගේ තාත්තලා ඇයි මෙහේ ආවේ අශි........"පවි ඇහුවා.......

ඇයි.......ඔයා විතරක් ප්‍රශ්න අහන්නේ අනිත් කෙනාට කටක් නැද්ද........"එහෙම කියලා අශි මම දිහා බලන කොටයි මම හරි සිහියට ආවේ.........

ආ මේ මේ....□□" අශි එහෙම එක පාරට කියපු නිසා.....මාව ගොත ගැහුනා.....මම ගොත ගහපු නිසා පවිට හිනා ගියා.........😂😂මේකි වගේ යාළුවෙක්...මට මොකක් හරිම වෙනවානම් මේකිට සතුටුයි......හිනා වුනු කැත......මොනවත් අහන්න කියන්න කලින් කාර් එක ඇවිත් අපේ ගෙවල් ලග නතර කලා.......

ඔන්න ළමයි දෙන්නාවම මම ගෙනත් බැස්සුවා......☺" අශි කිව්වා.....අපි කාර් එකෙන් බැස්සා...

තැන්ක්ස් අශි....☺☺☺" මමයි පවියි අශිට කියලා ආවා........පවියි මායි මගේ කාමරේට ඇවිත් ඇදෙන් ඉදගත්තා .......

දැන් කියපන් උඹ මොකද අශි ලගදි ගොත ගැහුවේ..........□□"පවි එක පාරටම මගෙන් ඇහුවා.......

ම....ම...ගොත ගැහුවේ නෑ බන්.......ම..ට.. මොකක්ද අහන්නේ කියලා හිතාගන්න බැරි වුනා......."පවිට බොරුවක් කරලා නැති නිසා..බිම බලන් මම කිව්වා........

ඒ කියපු එක මම දිහා බලන් කියපන්......බිම බලන් කියන්නැතුව......අනික උඹ අශිගේ කාර් එකට නැග්ග වෙලාවේ ඉඳලා මේ ලෝකේ නෙවෙයි හිටියේ.......ඒකටත් එක්ක උත්තරේ දිපන්........."පවි කිව්වා........මගේ අම්මාට,තාත්තාට පස්සේ මගේ ලගින් හිටිය එකම කෙනා පවි......

අනේ පවි......"හිතට දැනුන දේ පවිට කියන්න බැරිව මම අසරණ වුනා......

අනේ පනේ නෙවෙයි කියපන්....."පවි කිව්වා......මගේ හිතේ අශි ගැන අමුතු හැඟීමක් තියෙනවා......එයාව දැක්ක වෙලාවේ ඉඳන් හිත එයාවම හොයනවා කියලා මම පවිට කිව්වා.........

ඉතින් මැට්ටියේ ඒක හිතේ තියන් ඉන්න ඕනේද.....අශිට කියන්න එපැයි....."පවි අහන් ඉඳලා කිව්වා.....

පිස්සුද පවි......මම වගේ මහත කෙල්ලෙක්ට එයා වගේ හැන්ඩ්සම් කෙනෙක් කැමති වෙයිද......"මම කිව්වා.....

අනේ චබි.....අශි එහෙම හිතන එකක් නෑ........අපි අශිට කියලා බලමු....ඊට කලින් උඹ ටිකක් අශිට ලං වෙයන්......."පවි කිව්වා.....පවියි මායි ඊට පස්සේ රටේ තියන වල්පල් දෙඩවලා යන්න ගියා......

###############

සති ගණන් මාස දෙකක් විතර ගියේ අශිත් මාත් හොඳ යාළුවෝ වෙලා.......අශියි මායි හොඳම යාළුවෝ වෙන්න හේතුව පවි........පවි කරන්න කියපු දෙවල් වලින් මායි අශියි හොද යාළුවෝ වුනේ.......

චබියෝ.....ඒ නැගිටපන්කෝ ගෑනියේ........."

මොකද පවි බෙරිහන් දෙන්නේ.........."

දැන් අශිත් උඹේ හොද යාළුවෙක් නිසා.....උඹේ හිතේ තියන දේ අද හෙටම කියපන්.......තවත් පහු නොකර........"පවි කිව්වා.......

අනේ පවි.....එක කිව්වාට පස්සේ තියෙන යාළුකමත් නැතිවෙයි පවි........."

අනේ මේ මගෙන් කුනුහරුප අහගන්න එපා.......උඹ අද හෙටම ඒ ගැන කියපන්......😩😩"පවි කිව්වා...........

හ්ම් හා..........මම කියන්නම්.....😔😔"

##############

අශියි මායි වෙනදා කතා කරන තැන කතා කර කර හිටියා.........

අශි මට දෙයක් කියන්න තියෙනවා.......😟😟"මම අශිට කිව්වා........

කියන්න චබ්......😮"

මේකයි.........ම....ම මේ......□😭"

ඇයි චබ්.........□"

මේකයි...මම ඔ...යාට ආදරේ ක...රනවා........😲😮"මම කිව්වා.....මම කිව්ව එක අදහගන්න බැරිව වගේ මගේ දිහා ටික වෙලාවක් බලන් ඉදලා.......අශි එක පාරටම ඉදන් හිටපු බංකුවෙන් නැගිටලා........උඩ පැන පැන හිනා වුනා.......😂😂😂

මොකක්ද චබ්.......ඔයා මට ආදරෙයි 😂😂😂😂😂....."

ඔව්.....😔😔"මම බිම බලාගෙන කිව්වා.......

තමුසේ කොච්චර මහතද.........කියලා දන්නවාද ......ඔයාට මම වගේ කෙනෙක් ගැලපෙනවාද.........ඔයා ඔයාට ගැලපෙන කෙනෙක් හොයාගන්න........අනික මම මෙහෙම කතා කරාම තමුසේ හිතුවාද මම තමුසේට ලව් කියලා........යාළු කමට කතා කරම එනවා.......ආදරේ කියාගෙන.......😩😩"අශි මට එහෙම කියලා යන්න ගියා.....ඇස් වලින් කදුලු වැටුනේත් කොච්චර වෙලාවක් එතන ඉදන් ඇඩුවාද මට මතකයක් නෑ.......

චබ්.......😟"පවි ඇවිත් මගෙ උරහිසට අත තිබ්බා........

චබියෝ මොකක්ද වුනේ..........😮"පවි මාව හෙලෙව්වා......

කතා කරපන් චබී......මොකක්ද වුනේ........"පවී ඇහුවාට මට කතා කරන්න වචන ආවේ නෑ.....මාව ගොළු වෙලා......

අනේ පවී........"මම අඩ අඩම පවීව තුරුල් කරගත්තා........

මොකක්ද වුනේ චබී.......අඩන්නේ නැතුව කියපන්......"මම පවීට අශි කියපු දේවල් කිව්වා........

උඹ අඩන්නේ නැතුව ඉදපන්.........උං කවුද උඹට ඔහොම කියන්න........මම ඌට හොද දෙකක් කියලා එන්නම්....."එහෙම කියලා පවී බංකුවෙන් නැගිටින්න ගියා.......මම පවීගෙ අතින් අල්ල ගත්තා........

ප්ලිස් පවී........මොකුත් කියන්න එපා......එයා කිව්වේ ඇත්තනේ මම එයා වගේ කෙනෙක්ට ගැල පෙන්නෑ.......පිලිස් මේක මෙතනින් නතර කරන්න........"

උඹට පිස්සුද චබී මේක මෙතනින් නතර කරන්න..........."

ප්ලිස් පවී මම වෙනුවෙන්...."මම අඩ අඩම කිව්වා........ඊට පස්සේ පවී මගේ ලගින් ඉදගත්තා.......මගේ හිත හැදෙන්න කතා කියලා මගේ හිත හැදුවා.......පවී දුක් වුනේ ඒක වුනේ එයා නිසාමයි කියලා.....එයා කියපු නිසා මම ආදරේ කියපු නිසා කියලා........මම පවී නිසා......අඩන එක නතර කරා........පැය දෙකක් විතර ඉදලා පවී මාව ගේ ලගින් දාලා ගියා.......

#########

සති දෙකක් ගියාත් මට අශිව අමතක කරන්න බැරි වුනා..........එත් මම පවීට පෙන්න සතුටින් හිටියා.......මගේ හිත විතරයි දන්නේ මම විදපු වේදනවා..........අශිගෙයි මගෙයි තිබ්බ හිතවත් කම් ඔක්කොම එදා නැති වුනා........අශි මාව දැක්කාම අහක බලන් යන්න පටන් ගත්තා.......එවා දැක දැක මට තවත් මෙහේ ජීවත් වෙන්න බැරි වුනා......මේ මොනවත් මම පවීට කිව්වේ නෑ........පවී නිසා මෙහෙම වුනේ කියලා එයා තාමත් හිතන් ඉන්න නිසා........මම තීරණයක් ගත්තා

අම්මේ........"මම අම්මා ලගට ගිහින් බෙල්ල බදාගත්තා....

ඇයි දූ......."

මේකයි මගේ සුදූ බොලේ........."

මොකද මේ කවදාවත් නැතුව මට බටර් ගාන්නේ........"

මේකයි.........අම්මේ මට ටික දවසකට බාප්පා ගාවට යන්න ඕනේ........ගෙදරම ඉදලා එපා වෙලා...😒😒"තාත්තගේ මල්ලි හිටියේ ඕස්ට්‍රේලියාවේ.......අශිව දැක දැක මට එයාව අමතක කරන්න බැරි නිසා......මම ඒ තීරණය ගත්තේ.........

ඇයි දූ එ.....එක පාරටම එහෙම තීරණයක් ගත්තේ......😮"

විශේෂ හේතුවක් නෑ අම්මා.....මට ටිකක් අක්කිලා එක්ක ඉන්න හිතුනා.......ඒකයි යන්න ඇහුවේ.......😒😒"බාප්පාට දූවලා දෙන්නෙක් ඉන්නවා.......

බලමු තාත්තාගෙන් අහලා..........😮"අම්මා කිව්වා.......

මගේ හොඳ අම්මා.......😍😍" අම්මාවත් කිස් කරන් මම රූම් එකට ආවා.......

###############

දූ...........😮"මම කාමරේට වෙලා පොතක් කියව කියව ඉන්න කොට තාත්තා ඇවිත් කතා කරා.......

මේ එනවා තාත්තා........😑😑"මම පොත පැත්තකින් තියලා......ගියා......තාත්තා සාලේ පුටුවකින් ඉදගෙන හිටියා...මම ගිහින් තාත්තා ලගින් ඉද ගත්තා.........

ඇයි තාත්තා......😟😟"

අම්මා කියන එක ඇත්තද දූට මල්ලි ගාවට යන්න ඕනේ කියන්නේ......"

ඔව් තාත්ති.......මම කාලෙකින් එහේ ගියෙත් නෑනේ ටික කාලයක් එහේ අක්කිලා එක්ක ඉදලා එන්නද තාත්ති........අනේ ප්ලීස්........ප්ලීස්.........."මම තාත්තාව තුරුල් කරන් ඇහුවා..........

හරි හරි........බටර් ඕනේ නෑ......මේ සතියේ ලෑස්ති වෙන්නකෝ..........මම ඔක්කොම රෙඩි කරන්නම්........"තාත්තා කිව්වා.......

මගේ හොද තාත්ති........😇"

හොද තාත්ති නොවෙයි.......මාස දෙකකින් එන්න ඕනේ හරිද.....☺"

අනේ තාත්ති අවුරුද්දක් විතර ඉදල එන්නම්කෝ..........😔😔අනේ තාත්ති ප්ලීස්........😔"

හ්ම් හරි.......අවුරුද්දයි......"

මගේ හොද තාත්ති උම්ම්මා 😚😚"

############

සතියකුත් ගියේ හරිම ඉක්මනින්..........අම්මාටයි තාත්තාටයි මම යාළුවන්ට කියන්න කිව්වේ......බාප්පා කතා කරපු නිසා යන්නේ කියන්න කියලා.......නැතිනම් ගොඩක්ම දුක් වෙන්නේ පවිනි නිසා........නැතිනම් පවි හිතයි මම හිත හදාගන්න බාප්පා ලගට යනවා කියලා..........හෙට තමයි යන්න තියෙන්නේ......යන්න කලින් එක පාරක් මට අශිව බලන්න තියෙනවානම්.........එහෙම හිතලා මම අශිට කොල් කරා........

හෙලෝ.......☺"අශිගේ කට හඩ එහා පසින් අ ැහුනා......

හෙලෝ අශි මම චබි...ඔයා එක්ක ටිකක් කතා කරන්න ඕනේ........පුළුවන් ද.........😮"

ආ කියන්න චබි......☺" වෙනදා තරම් හිතවත්කමකින් කතා නොකලත් අශි මාත් එක්ක කතා කලා.......

ඔයාව දැන් මීට් වෙන්න පුළුවන් ද.......��😭"

හ්ම්........දැන්ද........පුළුවන්........☺"

එහෙනම් අරලිය ගහ ලඟට ටිකක් එනවද.......��😭"මම කිව්වා.....

හරි මම විනාඩි පහෙන් එන්නම්.........☺"එහෙම කියලා අශි ෆෝන් එක කට් කලා.........මමත් අරලිය ග ලගට ආවා.......ටික වේලාවකින් අශි එතනට ආවා.........ඇවිත් බංකුව උඩින් ඉදගත්තා........

කියන්න චබි මොකක්ද කියන්න තියෙන්නේ.......☺"අශි ඇහුවා......

මේකයි......මම එදා කිව්ව එකට සමාවෙන්න......අශී.......ඔයාව දැක්ක වෙලාවෙමයි මම ඔයාට ආදරේ කරේ......😔මම ඒ ආදරේ හිතේම තියන් ඉන්නයි......හිතුවේ.......ඒත් ඒක හිතේම තියාගන්න බැරි වුනා.......😔ඒකයි මම එදා එහෙම ඔයාට කිව්වේ......මම මහත ඇති.....ඒකයි කියලා මගේ හිතට ආදරයක් නොදැනෙන්න තරම් අමනුෂ්‍යයෙක් නෙවෙයි......😔😔😞මටත් හැඟීම් දැනීම් තියෙනවා.........මගේ ඇග ගැන හිතලා ඒක නොකියන්න බෑ අශී.....සමාවෙන්න.........😔😞මම යනවා අශී රට ඒක කියන්නයි මම ආවේ ආයේ මම ඔයාට කරදරයක් වෙන එකක් නෑ..........😢😩😩"කියන්න ඕනේ ටික මම කියලා අශීගේ දිහා බලන්නේවත් නැතුව මම බංකුවෙන් නැගිටලා ගෙදර ආවා.........😔

###########

දූ පරිස්සමින් යන්න.........බාප්පා එයි එයාපෝට් එකට.......😩😩"තාත්ති මාව තුරුල් කරන් කිව්වා.......

දූ පරිස්සමින්.......අක්කිලා එක්කම ඉන්න.........😢😢"අම්මා අඬ අඬ මාව තුරුල් කරන් කිව්වා..........

පරිස්සමින් පලයන් බන්....උඹ මට නොකිව්වාට අශී නිසායි යන්නේ කියලා මම දන්නවා....පරිස්සමින් පලයන් උඹට කවදාවත් නරකක් වෙන්නේ නෑ........උඹේ ඔය හොද හිතට..........😭😭😩😢"පවි මාව තුරුල් කරන් කිව්වා.........එක කුසක ඉපදුනේ නැතත් පවි මගේ ලගින් හිටියේ මගේම සහොදරියක් වගේ........ඔක්කොමලාගෙන් සමු අරන් මම ඇවිත් ප්ලෙන් එකට ආවේ......හැමදෙයක්ම අමතක කරන්න ඕනේ නිසා.......අම්මාට තාත්තාට මම ගැන පවිට හැරෙන්න කවුරු ඇහුවත් කියන්න එපා කියලා ආව නිසා....ඒ මතකයන් ඉක්මනින් අමතක කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.........එහෙම හිතලා මම ඇස් දෙක පියාගත්තා..................😩😩😢

💖පපුතුරේ සඟවාගෙන..ඔබේ නමට සෙනෙහසක්..😐

හැරදාලා යන්නේ මා නුඹව හිමි නෑ කියා..😔

සත්තකින් ආදරේ දැනුනා නම් ඔය සිතට 💖

යළි එන්න මා සොයා...මඟ බලා හිදිමි හැමදාක.. 😔

චබී💖

##########

(මෙච්චර වේලා චබීනේ කතාව ගෙනිච්චේ.....චබී රට ගිය වෙලාවේ ඉදන් අශී තමයි කතාව ගෙනියන්නේ........)

අශී.......😟" කවුද කතා කරපු නිසා මම හැරිලා බැලුවා.........හිටියේ පවි චබීගේ හොදම යාළුවා........

ආ මේ පවිනේ......🙂"

මට ඔයා එක්ක කතා කරන්න පුළුවන් ද.......😒"

මොනවදා පවි.......🙂😒"

අපි පොඩ්ඩක් අයිනකට යමුද.........😒😒😟"

යමු......🙂" එහෙම කියලා අපි දෙන්නාම ආවේ........ග්‍රවුන්ඩ් එකේ අරලිය ගහ ලඟට.........ඇවිත් බංකුවෙන් ඉදගත්තා

කියන්න පවි.....🙂"

ඔයා දන්නවාද චබි රට ගියේ ඔයා නිසා කියලා...........😟😟"

මොකක් මම නිසා......ඒ මොකටද මම නිසා රට යන්නේ පිස්සුද........😮□😟"පවි ඒ කියපු දේට මට කේන්ති ගියා......

පිස්සු මට නෙවෙයි ඔයාට......කෙනෙක්ට බනින්න කලින් ඔයාට හිතන්න තිබ්බා.....එයාගේ මානසිකත්වය ගැන........😟😟"

එයා වගේ කෙනෙක්ව මට ගැලපෙනවාද.....😟😟"

එයාගේ මහත ගැනද ප්‍රශ්නේ........😟😟එයාගේ ගතිගුන නිසා ඔයා යාළුවෙක් වුනේ නැද්ද අශි.........😮එයගේ ගතිගුන වලට කැමති ඔයා එයාගේ මහතටද අකැමැති වුනේ අශි............😟"

ඔව්......😟"මම කිව්වා

එයා මහත් වුනේ ඇයි කියලා ඔය දන්නේ නෑ අශි.....එයාට පොඩි කාලේ ලෙඩක් තිබ්බා.........එයාට එතකොට අවුරුදු 13යි.....ඒ ලෙඩේට ගහන්න තිබ්බ බෙහෙත නෙවෙයි ඒ ඩොක්ට ගැහුවේ........වෙන ලෙඩෙක්ට ගහන්න තිබ්බ බෙහෙත් එකක්.........ඒකෙන් එයාට ගොඩක් අමාරු වුනා සති තුනක් ICU එකේ හිටියා........ඩොක්ටගේ අතේ වැරැද්ද......එයාව බේරගන්න බෑ කිව්වා......ඒත් දෙවියෝ එක චාන්ස් එකක් දුන්නා.....ඒ එයාගේ ජීවිතේ බේරගත්තා........එයාලගේ අම්මලා ඒ ඩොක්ටර්ට නඩු දැම්මා........චබි කියපු නිසා....ඩොක්ටර්ව නිදහස් කලා........චබි කිව්වේ වෙන්න තියෙන දෙයක් වලක්වන්න බෑ.....එක වෙලා ඉවරයි කියලා........."පවි එ කිව්ව කතාවට මගෙ හිත හෙල්ලුනා.......

අනික චබි ඔයාට ආදරය කරනවා කියලා.......😏ඔයාට කියන්න කියලා බල කරේ මම මොකද මම හිතුවා....😒ඔයා අවංකවමයි චබිව යාළුවෙක් වගේ හිතන්නේ කියලා.......😏ඔයාලා යාළුවෝ වගේ ඉදපු දවස් ටිකේ දෙන්නා ඉදපු විදියට ඕනේ කෙනෙක් හිතන්නේ ඔයාලා දෙන්නා ආදරේ කරන දෙන්නෙක් කියලා...........😟චබි රට ගියේ ඔයාව අමතක කරන්න........හැබැයි එක දෙයක් ඔයා මොනවා කියලා චබිට බැන්නත් චබි වෛර කරන කෙල්ලෙක් නෙවෙයි.........මම යනවා.......😏😏"එහෙම කියලා පවි නැගිටලා ගියා......පවි ඒ කියපු හැම වචනයක්ම මගේ හිත හෙල්ලුවා......චබිව දැක්ක මුල්ම දවසේ ඒ ඇස් මගේ හිත හෙල්ලුවාට එයාගේ අසාමන්‍ය මහත ඒ හොල්ලපු හිත වෙනස් කලා..........චබි මගේ හොදම යාළුවෙක් වුනෙත් කාලයත් එක්කමයි........එදා චබි ආදරෙයි කිව්වා.......මට මගේ කේන්තිය පාලනය කරගන්න බැරුව කොච්චර දේවල් කිව්වද........ඒ නිසා මම දුක් වුනා.......අකැමැතියි විතරක් නොකියා.......මහතයි කියලා බැනපු නිසා........මම නිසාද චබි රට යන්න

ගියේ..........ඕ ශිට්.........😢😢

හලෝ අංකල්........😊"මම චබිගේ ගෙදර ගියේ චබි ගැන අහන්න......

හලෝ පුතා එන්න එන්න........😊"කියව කියව හිටපු පත්තරේ ස්ටූල් එක උඩ නවලා තියලා මට චබිගේ තාත්තා කතා කරා......

ඉතින් අංකල් කෙහොමද........😊"

හොදින් පුතා.....දුව ගියත් හරි කට්ටිය මේ පැත්තට ආවෙත් නැ.........😊"

එහෙම එකක් නැ අංකල් කට්ටිය මේ එක එක වැඩ වලට හිර වේලානේ........😒"

හරි හරි පුතා ඉතින් මොකද මේ පැත්තේ.........😊"

නිකන් අංකල්.....ඔයාලාව බලලා යන්න හිතුනා.......චබි එහෙම කතා කලේ නැද්ද අංකල්.......😊"අහන්න ඕනේ කියලා හිතපු එක කෙහොම හරි ඇහුවා.....

නැ පුතා ගියා කියලා කතා කලා පස්සේ කතා කරන්න හම්බ වුනේ නැ.........එයා එනකම් කතා කරන්න එපා කියලා.......ඒ නිසා අපිත් ගත්තේ නැ........😏😏😟😒😟"අංකල් එහෙම කිව්වාම බලාපොරොත්තු ඔක්කොම බිද වැටුනා...........ටික වේලාවක් අංකල් එක්ක කතා කර කර ඉදලා මම ගෙදර ගියා

##########

පවි.........😒"

ඇයි.......😟"මගදි පව්ව හම්බ වුන නිසා චබි ගැන අහන්න මම පවිට කතා කලා.........

කතා කරන්න පුළුවන් ද.......😒"

කියන්න.......😮"

පවි.....ම..ම චබිට....ආදරෙයි 😒😒😒......."

මොකක්.........😏"

ඔව් පවි.....එයා ලග ඉන්නකම් මට දැනුනේ නෑ...එයා ගියාට පස්සේ දැනුනේ අනේ පවි.......චබිව ගෙන්නලා දෙන්න.........😓😓😢"මම පවිට කිව්වා.........

චබි ගියාට මට කතා කලේම නෑ අශි එයා හිත හදාගන්න ගියේ.......එයාම කතා කරනකම් අපිට කතා කරන්න විදිහක් නෑ........😓😓"පවි කිව්වා.........

ඒත් පවි.......😓😓"

වැඩක් නෑ අශි එයා එනකම් කතා කරන්න විදිහක් නෑ..........😓"

💔ඔබගෙ සිත රිදෙව්වට ආදරෙයි මගෙ මැණික😍

යළි හිදිමු යහලු වී අපි අපේ වූ ලොවක..🌍

ඔබ නැතුව ගෙවූ දින..මතකයන් වද දුන්න.. 😒

එන්න මගෙ තුරුලටම යලි කිසිදා නොයන්න..😮

අශි💔

############

#අවුරුද්දකට_පසු

චබී මගෙන් ඈත් වුනාම දැනුන එයාගේ ආදරේ අමතක කරන්නේ නැතුව මම හිතේ තියන් හිටියා.......පවිගෙන් මම චබී ගැන හැමදාම ඇහුවත් පවි ලග හැමදාම තිබ්බේ එකම උත්තරයයි.......එයා කතාකරනකම් එයාට කතාකරන්න විදිහක් නෑ කියලා.........මම තාත්තාගේම කම්පැණි එකට එකතු වුනේ චබීව මතක් වෙනවා වැඩි නිසා........😓😓

හෙලෝ......😊"

හොලෝ අශි.........මම පවි.....😊"

ආ කියන්න පවි.......😊"

ඔයාට දෙයක් කියන්න කතා කලේ........හෙට චබී එනවාලු.....එයා කතා කලා දැන් ටිකකට කලින්........😊😊"පවි ඒ කියපු දේ මට අදහාගන්න බැරි වුනා........ඉදගෙන හිටපු පුටුවෙන් නැගිටුනේ ඉබේමයි.......

මො...ක....ක්ද........ඔය ඇත්තමද පවි..........😮😮"

ඔව් අශි චබී......හෙට ලංකාවට එනවාලු.........😊😊"

තැන්ක්ස් .........තැන්ක්ස් .......පවි තැන්ක් යූ වෙරි මච්...........😊😊😊"මම ෆෝන් එක කට් කරලා උඩ පැන්නේ සතුට වැඩි කමට........

#############

අද චබී එන දවස එයාව දකිනකම් ඉවසිල්ලක් නෑ.........එයාව තුරුල් කරන් ආදරෙයි කියන්න.....එයාගෙන් මම කියපුවාට සමාව ඉල්ලන්න.........මම බැල්කනි එකට වෙලා චබී ගෙදර එනකම් බලන් හිටියා.......චබීගේ තාත්තාගේ කාර් එක වත්ත ඇතුලට දානවත් එක්කම මම දුවලා ගිහින් පල්ලෙහාට ගියා..........එත් චබීගේ ගෙදරට යන්න හිත කැමති වුනත් එ හිත ගලක් කරන් අයේ කාමරයට ගියා..........ගිහින් චබීගේ රූම් එක තියෙන පැත්ත බැලුව ගමන් ඒ රූම් එකේ ලයිට් එක පත්තු වුනා.........ඒ කියන්නේ ඇත්තටම චබී ඇවිත්........චබී එක්ක කතා කරන්නේ කෙහෙමද කියලා හිතන කොට මතක් වුනේ පවිව..........

හොලෝ පවි.........😒😔"

කියන්න අශි........😊"

මට චබීව බලන්න ඕනේ පවි..........මොනවා හරි කරන්නකෝ.......😮😮😔"

හ්ම්…….මම මොනවා හරි කරලා….එක්ක එන්න බලන්නම්……එනවානම් මම මැසේජ් එකක් දාන්නම්……"එහෙම කියලා පවි ෆොන් එක තිබ්බා…….පවි කොහොම හරි චබ්ව එක්ක එයි කියලා…හිත කිව්වා….එහෙමම හිත හිත ඉන්න කොට ෆෝන් එකට මැසේජ් එකක් ආවා……මැසේජ් එක ඇවිත් තිබ්බේ පවිගෙන්

(තාව විනාඩි 5කින් ග්‍රවුන්ඩ් එකේ අරලිය ගහ ලඟට එන්න) පවිගේ මැසෙජ් එක දැකලා මම උඩ පැන්නා……..එහෙමම ලැස්ති වෙලා මම ග්‍රවුන්ඩ් එක ලඟට ගියා……..අරලිය ගහ ලගට වේලා ඉදගෙන ඉන්න කොට……පවි ආවා……

පවි කෝ චබි……ඔයා එක්ක එනවා කිව්වානේ……….□□"පවි විතරක් තනියෙම නිස ඇහුවේ……..පවිගේ ඇස් වලින් පිටිපස්ස පෙන්නද්දි මම පිටිපස්ස හැරිලා බැලුවා………චබි……..චබි ලස්සන වෙලා කෙට්ටු වෙලා……..එයා ඉස්සර මහත කෙනෙක්ද කියලා හිතා ගන්න බැරි තරම් කෙට්ටු වෙලා හිටියා……..

ච……බි……මේ ඔයාද……" මම කතා කරන්න පුළුවන් වුනු මොහොතෙම කතා කලා………..

ඔව් අශි…….පුදුමයිද……..එදා එහෙම විහිළු කරපු කෙල්ල මෙහෙම ඇවිත් ඉන්න කොට……."චබි ඇහුවා…….ඒ වචන මගේ හිත රිද්දුවා…….එයාව දැකලා ආදරෙයි කියන්න හිතන් හිටිය වචන ටික ගොලු වුනා………

එහෙම එකක් නෑ චබි…මම එදා කියපු එකට සමාවෙන්න…… මම යනවා………" එහෙම කියලා මම යන්න හැරුනා……..

එ අශි…..ඔහොම ඉන්න……..“චබි කතා කලා මම නතර වුනා…….

මට ආදරෙයි කියලා කියන්නේ නැතුව යන්නේ ඇයි අශි……..“චබි ඇහුවා…….මොකක්……. මට හරියට ඇහුනාද………මම චබි හිටිය පැත්තට හැරුනා……..චබියි,පවියි හිනා වෙවී මගේ

දිහා බලන් හිටියා…….

මො..ක…ක්..ද චබි.කිව්වේ………"මට ඇහුනා වැරදිද කියලා ආයේ ඇහුවා……

මම ඇහුවේ මොඩයෝ මට ආදරෙයි කියන්නේ නැතුව යනවාද කියලා……."ඒ වචන ටික ඇහුන ගමන් ගිහින් මම චබිව තුරුල් කරගත්තා……….

මම ආදරෙයි චබි ගොඩක් ඔයාට "මම චබිව තුරුල් කරන් ඒ හිස සිපගෙන කිව්වා

මම දන්නවා අයි........පව් හැමදෙයක්ම මට හැමදාම කිව්වා....ඔයාගේ හැමදේම මට පව් කිව්වා...........එදාම එන්න හිතුනා......එත් මට හිතුනා වෙනස් වෙලාම එන්න ඉතින් වෙනස් වෙලා ආවා...........☺☺☺"

ඔයා ඉස්සර වගේ ආවත් මම ඔයාට ආදරේ කරනවා චබි......ගොඩක් ආදරේ කරනවා...........❤"මම තව තවත් චබ්ව තුරුල් කරගත්තා..........

💖තනිකමින් මියැදුණු මගේ දෙනෙතට.....

අනන්තයක සිහින අරන්........

මතක මං පෙත් විවර කරන්......

ඔබ ආවා මගේ හදට....

පාළු සුළගේ පව් ගිය සිත.......

අඟුලා දා එක්තැන් කරන්නට.......

මුළු ලොවෙහිම හැකි වුයේ......

ඔබට පමණයි හිමි සඳ........

මට උරුමයි ඔය නෙතු අද........

දරාගන්න බැහැ සොම්නස........

ආදරයෙන් පිරි ඔබේ හදවත........

රැක ගනිමි මගේ දිවි තිබෙන තුරාවට.........

👩 චබි❤

💖නුඹ එබි ඇස්දෙකට.......සිපගත්තු ආදරේ.......

සත්තමයි දැනෙනවා නුඹ දුන්නු ආදරේ.........

ලංවෙලා පපුතුරට උණුහුමට ගුලිවෙලා........

ආදරේ බිඳෙන් බිඳ මගේ සිතට කොඳුරලා.......

සත්තමයි ආදරෙන් නුඹ මාව පුරවලා......

👤අයි❤

ඉවරායි😍😍😍😍

########

ඉතින් චබියි අයියි මැරි කරාලු ළමායි............

**ඉතින් තවත් කතාව නෑ**

**ඉවරායි.....මොනා හරි කියන් යමු කට්ටිය දැනුන දේ........**

**කියන්න තියෙන්නේ මේච්චරයි.............**

**#කෙනෙක්ගේ_අඩුපාඩුවකට_හිනාවෙන්න_එප_එ_කෙනාටත්_අපේ_හිත්_වගේම_හැඟිම්_දැනිම්_තමයි_තියෙන්නේ_**

**ලිව්වේ මම යශ්**

**Yash💔**